90765

OL/2023(2024)/43-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 S I**

| පත්‍රය | ලකුණු |
|---|---|
| I | |

| | |
|---|---|
| පරීක්ෂක 1 | |
| පරීක්ෂක 2 | |
| EMF | |

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**


චිත්‍ර I
சித்திரம் I
Art I

පැය එකයි
ஒரு மணித்தியாலம்
*One hour*

✻ **සියලු ම** ප්‍රශ්නවලට **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** පිළිතුරු සපයන්න.

**විභාග අංකය** :....................................

● පහත සඳහන් ඡායාරූපය ඇසුරු කරගෙන අංක **1** සිට **5** තෙක් ප්‍රශ්නවල හිස්තැන් පුරවන්න.



**1.** මෙම වාස්තු විද්‍යා නිර්මාණය ................................................ නමින් හැඳින්වේ.

**2.** මෙම ගොඩනැගිල්ල හැඩ ගන්වන ලද ................................................ මත ඉදි කොට ඇත.

**3.** මෙය ................................................ වාස්තු විද්‍යා නිර්මාණ ලක්ෂණ අනුව ඉදි කොට ඇත.

**4.** මෙම ගොඩනැගිල්ල මණ්ඩපය, ................................................ හා ගර්භ ගෘහය යන කොටස්වලින් යුක්ත ය.

**5.** මහල් තුනකින් යුත් මෙහි පියස්සේ මුදුන් මහල වසා ඇති ................................................ අටපට්ටම් හැඩැති ය.

[දෙවැනි පිටුව බලන්න.

- අංක **6** සිට **10** තෙක් දී ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

**6.** ශ්‍රී ලංකාවේ සාම්ප්‍රදායික මැටි කර්මාන්තය ආශ්‍රිතව භාවිත වූ ඉපැරණිම තාක්ෂණික මෙවලම කුමක් ද?

......................................................................................................................................

**7.** දුම්බර පැදුරු කර්මාන්තයේ දී මිශ්‍ර සැරසිලි සහිත කළාල කුමන නාමයකින් හැඳින්වේ ද?

......................................................................................................................................

**8.** මහාචාර්ය පරණවිතානයන් 'අග්නි හා පර්ජන්‍ය' ලෙස හඳුන්වනු ලබන කැටයමෙහි, මානව රූපය වාඩි වී සිටින ඉරියව්ව හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

......................................................................................................................................

**9.** යුරෝපීය මූර්ති ශිල්පියෙකු වූ හෙන්රි මුවර් ප්‍රමාණයෙන් විශාල වියුක්ත මානව රූප නිර්මාණයේ දී අනුගමනය කළ ආවේණික විශේෂ ලක්ෂණය කුමක් ද?

......................................................................................................................................

**10.** සන්නිවේදන මාධ්‍යයක් ලෙස සිද්ධීන් හා චරිත, හාස්‍ය හා අතිශයෝක්ති ලෙස දක්වමින් අඳිනු ලබන චිත්‍ර විශේෂය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?

......................................................................................................................................

- අංක **11** සිට **15** තෙක් දී ඇති එක් එක් ප්‍රශ්නයට වඩාත් නිවැරදි පිළිතුර තෝරා, ඊට **යටින් ඉරක් අඳින්න**.

**11.** මුරගල නිර්මාණයේ ආරම්භක අරමුණ වූයේ,
(1) බාහිර අලංකරණ අංගයක් සේ දැක්වීම ය.
(2) කොරවක්ගලට ආධාරකයක් ලෙස යෙදීම ය.
(3) ගාම්භීරත්වය හා තේජාන්විත බව මූර්තිමත් කර දැක්වීම ය.
(4) ස්ථානීය ආරක්ෂාව සැලසීම ය.

**12.** රෆායෙල් සන්සියෝ ශිල්පියාගේ 'ඇතන්ස් ගුරු කුලය' සිතුවම දක්නට ලැබෙනුයේ,
(1) ස්ටැන්සා ඩෙලා සිගන්චුරා මැදුරේ ය. (2) සිස්ටයින් දෙව් මැදුරේ ය.
(3) ලන්ඩන් ජාතික කලාගාරයේ ය. (4) ලූවර් කෞතුකාගාරයේ ය.

**13.** ථූපාරාම ස්තූපයේ ආරක්ෂාව සඳහා වටදාගෙයක් ගොඩනගන ලද්දේ,
(1) දේවානම්පියතිස්ස රජු විසිනි. (2) මහසෙන් රජු විසිනි.
(3) වලගම්බා රජු විසිනි. (4) ලජ්ජතිස්ස රජු විසිනි.

**14.** ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ගේ මතයට අනුව සීගිරි සිතුවම්වලින් නිරූපණය වනුයේ,
(1) අප්සරාවන් ය. (2) බිසෝවරුන් හා සේවිකාවන් ය.
(3) මේඝලතා හා විජ්ජුලතා ය. (4) අන්තඃපුර කාන්තාවන් ය.

**15.** බෞද්ධ විහාර සිතුවම්කරණයේ දී, ඉන්දීය අජන්තා, එල්ලෝරා හා භාග් වැනි ස්ථානවල කලා නිර්මාණයන් හි ආභාසය ලබා ගත් ශ්‍රී ලාංකේය චිත්‍ර ශිල්පියා වනුයේ,
(1) ඇම්. සාර්ලිස් ය. (2) සෝලියස් මැන්දිස් ය. (3) ජෝර්ජ් කීට් ය. (4) එල්.ටී.පී. මංජු ශ්‍රී ය.

- අංක **16** සිට **20** තෙක් දී ඇති වචනවල අර්ථය පැහැදිලි වන සේ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

**16.** ස්ථපතිරායර් : ......................................................................................................
......................................................................................................



**17.** යූපය/යෂ්ටිය : ......................................................................................................
......................................................................................................



**18.** රංජිත වීදුරු : ......................................................................................................
......................................................................................................

**19.** පාර්ශව දර්ශී : ......................................................................................................
......................................................................................................



**20.** ඇල්ටමීරා : ......................................................................................................
......................................................................................................



- අංක **21** සිට **25** තෙක් දී ඇති රූප සටහන්වලට කිසියම් සබඳතාවක් දක්වන රූප සටහන, ඉදිරියෙන් ඇති **A, B, C, D** සහ **E** යන ඒවා අතුරෙන් තෝරා, එහි අක්ෂරය **තිත් ඉර මත** ලියන්න.

**21.**  (.........)  **A**

**22.**  (.........)  **B**

**23.**  (.........)  **C**

**24.**  (.........)  **D**

**25.**  (.........)  **E**

- අංක **26** සිට **30** තෙක් දී ඇති එක් එක් වාක්‍යයෙහි හිස්තැනට සුදුසු **වචනය/වචන** යොදා වාක්‍ය සම්පූර්ණ කරන්න.

**26.** මහනුවර යුගයේ පහතරට ශෛලීය ලක්ෂණ සහිත සිතුවම් අතර සුතසෝම ජාතකයේ 'රජ මැදුරේ කාන්තාවෝ' සිතුවම ................................................................ විහාරස්ථානයේ දක්නට ලැබේ.

**27.** චිත්‍ර ශිල්පී ඩේවිඩ් පේන්ටර් විසින් මහනුවර ත්‍රිත්ව දෙව්මැදුරේ ඇඳ ඇති සිතුවම් සඳහා යුරෝපීය ................................................................ කලාවේ ආභාසය ලබා ඇත.

**28.** පැබ්ලෝ පිකාසෝ ශිල්පියා 'ගුවර්නිකා' සිතුවම නිර්මාණයේ දී සීමිත වර්ණ මාලාවක් වන අළු, සුදු, කළු පැහැති වර්ණ පමණක් භාවිත කරමින් ................................................ ස්වරූපයක් ගොඩ නගා ඇත.

**29.** අනුරාධපුර යුගයට අයත් ................................................................ බෞද්ධ විහාරස්ථානයක් වුව ද, ලෞකික තේමාවන්ගෙන් යුත් ගල් කැටයම් දක්නට ඇත.

**30.** යාපනයේ ඉනුවිල් පරරාසසේකර පිල්ලෙයාර් කෝවිලේ දක්නට ලැබෙන 'අගස්තියර් හා විනයාගර්' නම් සිතුවම ................................................................ ශිල්පියාගේ සිතුවමකි.

[හතරවැනි පිටුව බලන්න.

- අංක **31** සිට **35** තෙක් දී ඇති ප්‍රශ්නවලට **F, G, H, I, J** යන රූප සටහන් ඇසුරෙන් හිස්තැන් පුරවන්න.



F



G



H



I



J

**31.** **F** අක්ෂරයෙන් දැක්වෙන කලාකෘතිය .................................. ශිල්ප ක්‍රමය අනුව නිර්මාණය කර ඇත.

**32.** **G** අක්ෂරයෙන් දැක්වෙන රිද්මයානුකූල ස්ථම්භ සහිත ශෛලමය මණ්ඩපය .................................. වට වී ඇත.

**33.** **H** අක්ෂරයෙන් දැක්වෙන සාම්ප්‍රදායික සිංහල සැරසිලි ඒකකය .................................. මෝස්තර ගණයට අයත් වේ.

**34.** **I** අක්ෂරයෙන් දැක්වෙන චිත්‍ර ශිල්පී කේ. කනකසබාපතිගේ සිතුවම, .................................. මාධ්‍යයෙන් කළ නිර්මාණයකි.

**35.** **J** අක්ෂරයෙන් දැක්වෙන සිතුවම .................................. ශිල්පියාගේ නිර්මාණයකි.

- ඔබ වෙත සපයා ඇති වර්ණ චිත්‍රය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි අංක **36** සිට **40** තෙක් දී ඇති උප මාතෘකාවලට අදාළ ව අර්ථවත් වාක්‍ය **පහක්** ලියන්න. (තනි වචනයෙන් සපයන පිළිතුරු සඳහා ලකුණු **නොලැබේ.**)

**36.** ශිල්පියා : ..................................

..................................

**37.** තේමාව : ..................................

..................................

**38.** ශෛලිය : ..................................

..................................

**39.** සංරචනය : ..................................

..................................

**40.** සමස්ත නිමාව : ..................................

..................................

***

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 I**


අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023(2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023(2024)
**General Certificate of Education (Ord. Level) Examination, 2023(2024)**

**චිත්‍ර I / சித்திரம் I / Art I**

- ප්‍රශ්න අංක **36** සිට **40** දක්වා ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සිතුවම භාවිත කරන්න.

  வினா இலக்கம் **36** தொடக்கம் **40** வரையிலான வினாக்களுக்கு விடையளிப்பதற்கு கீழே தரப்பட்டுள்ள உருவப்படத்தினை பயன்படுத்துக.

  Use the following painting to answer the questions from No. **36** to **40**.



* * *

090765

OL/2023(2024)/43-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 | S | II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

චිත්‍ර II
சித்திரம் II
Art II

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

උපදෙස් :

- ඔබේ **විභාග අංකය** උත්තර පත්‍රයේ ඒ සඳහා වෙන් කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට ද්‍රව මාධ්‍ය භාවිතා කරන ලද සිතුවම් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, ටෙම්පරා සායම්, පැස්ටල් හෝ අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි ය.
- ද්‍රව්‍ය සමූහය 73cm පමණ උස පැතැලි ඩෙස්ක් එකක් මත තැබීමට ශාලාධිපතිවරුන්ට උපදෙස් දී ඇත.

**නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය**

- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කරන්න.

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න. මේ සඳහා ඔබට සපයා ඇති A 4 ප්‍රමාණයේ සුදු කඩදාසිය භාවිත කරන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ, වර්ණ කරන්න. මේ සඳහා සපයා ඇති විශේෂ චිත්‍ර ඇඳීමේ කඩදාසිය භාවිත කරන්න.

- **ඉහත 1 සහ 2 චිත්‍ර දෙක ම එකට අමුණා විභාග ශාලාධිපතිට භාර දෙන්න.**
- ඔබේ චිත්‍රය ඇගයීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

- **නිදහස් රේඛා අධ්‍යයනය**

1. මුල් කඩදාසියේ කරනු ලබන පූර්ව රේඛා අධ්‍යයනයේ දී දක්වා ඇති කුසලතා (ලකුණු 05)

- **වර්ණ චිත්‍රය**

2. ද්‍රව්‍ය සමූහය, තලය මත කලාත්මක ව සම්පිණ්ඩනය වීම (ලකුණු 05)
3. පරිමාණ, පර්යාලෝක රීති හා ත්‍රිමාණ ලක්ෂණ පිළිබඳ අවබෝධය (ලකුණු 05)
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය හා ගතිලක්ෂණ දැක්වීම (ලකුණු 05)
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතා (ලකුණු 05)
6. උචිත වර්ණවත් පසුබිමක් යෙදීම හා සමස්ත නිමාව (ලකුණු 05)

**සැලකිය යුතුයි:**

- ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල සම්පූර්ණයෙන්ම ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැළපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

* * *

OL/2023(2024)/43-S-III 90765

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

43 S III

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස් :**

* ඔබ ඇඳිය යුත්තේ **එක්** වර්ණවත් චිත්‍රයක් පමණි.
* ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ නියම කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
* උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට චිත්‍රය සම්පූර්ණයෙන් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
* දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
* චිත්‍ර ඇඳීමේ විශේෂ කඩදාසිය සමග A4 ප්‍රමාණයේ රළු කඩදාසියක් සහ ටිෂූ කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් ප්‍රශ්නයක් පමණක්** තෝරාගන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික ස්ථානයක් ඉදිකිරීමේ දී ශ්‍රමයෙන් දායක වන පිරිසක්
2. ජංගම බේකරි නිෂ්පාදන අලෙවි රථයකින් ආහාර මිලදී ගන්නා පිරිසක්
3. අභය භූමියක වන සතුන් නරඹන්නෝ
4. ඔබ සිත්ගත් ඓතිහාසික සිද්ධියක්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා වර්ණ භාවිත කර අඩි **6' × 8'** ප්‍රමාණයෙන් මේස රෙද්දක් ඇඳ වර්ණ ගන්වන්න. (පරිමාණානුකූලව තලයට ගලපාගන්න.)
6. සරමකට සුදුසු වාටි මෝස්තරයක් සත්ත්වරූප ඇසුරින් සැලසුම් කර උචිත පරිදි වර්ණ කරන්න.
7. නිවසක ආලින්දයේ තැබීමට සුදුසු විසිතුරු මැටි බඳුනකට නිර්මාණාත්මකව හැඩයක් සැලසුම් කර එයට ගැලපෙන සැරසිලි භාවිත කරමින් වර්ණ ගන්වන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ අගය විදහා දැක්වෙන පෝස්ටර් චිත්‍රයක් සැලසුම් කර වර්ණ කරන්න.
9. 'පාරම්පරික ජනකලා' මැයෙන් ලියැවුණු පොතකට සුදුසු වර්ණවත් පිටකවරයක් (මුල් පිටුව පමණක්) සැලසුම් කර වර්ණ කරන්න.
10. 'පිය සෙනෙහස' පිළිබඳ ලියවුනු කාව්‍ය පංතියකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් සැලසුම් කර වර්ණ ගන්වන්න.

* * *

සියලු ම හිමිකම් ඇවිරිණි.

රහස්‍ය ලේඛනයකි.

# ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

# 43 - චිත්‍ර

## ලකුණු දීමේ පටිපාටිය



මෙය උත්තරපත්‍ර පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා සකස් කෙරිණි.
ප්‍රධාන පරීක්ෂක රැස්වීමේ දී ඉදිරිපත්වන අදහස් අනුව මෙහි වෙනස්කම් කරනු ලැබේ.

අවසන් සංශෝධන ඇතුළත් කළ යුතුව ඇත.

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව**
**අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)**

**43 - චිත්‍ර**

**අවසාන ලකුණු ගණනය කිරීම.**

**I පත්‍රය -** විවිධ වර්ගයේ ප්‍රශ්න 40 ක් ඇතුළත් ප්‍රශ්න පත්‍රයකි. එක් ප්‍රශ්නයකට 01 ලකුණ බැගින් හිමි වේ.

(1 x 40) = ලකුණු 40

**II පත්‍රය -** නිශ්චල ද්‍රව්‍ය සම්පිණ්ඩනය.
එක් ප්‍රශ්නයක් පමණක් සැපයෙන අතර, ඒ සඳහා නිර්ණායක 6 ක් ඔස්සේ ලකුණු 05 බැගින් හිමි වේ.

(6 x 5) = ලකුණු 30

**III පත්‍රය -** චිත්‍ර සංරචනය/ මෝස්තර නිර්මාණය/ ග්‍රැෆික් චිත්‍ර ඇතුළත් කොටස් 03 කින් යුතු ප්‍රශ්න පත්‍රයකි.
මින් තෝරාගත් එක් චිත්‍රයක් පමණක් ඇඳිය යුතු වේ.
නිර්ණායක 05 ක් ඔස්සේ ලකුණු 06 බැගින් හිමි වේ.

(5 x 6) = ලකුණු 30

**මුළු එකතුව ලකුණු 100**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)
## උත්තරපත්‍ර ලකුණු කිරීමේ පොදු ශිල්පීය ක්‍රම

උත්තරපත්‍ර ලකුණු කිරීමේ හා ලකුණු ලැයිස්තුවල ලකුණු සටහන් කිරීමේ සම්මත ක්‍රමය අනුගමනය කිරීම අනිවාර්යයෙන් ම කළ යුතුවේ. ඒ සඳහා පහත සඳහන් පරිදි කටයුතු කරන්න.

1. සෑම සහකාර පරීක්ෂකවරයකුම උත්තරපත්‍ර ලකුණු කිරීමට රතුපාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කරන්න.
2. ප්‍රධාන පරීක්ෂක විසින් දම්පාට බෝල් පොයින්ට් පෑනක් පාවිච්චි කළ යුතුය.
3. සෑම උත්තරපත්‍රයක ම මුල් පිටුවේ සහකාර පරීක්ෂක සංකේත අංකය සටහන් කරන්න.
   ලකුණු සටහන් කිරීමේ දී **පැහැදිලි ඉලක්කමෙන්** ලියන්න.
4. ඉලක්කම් ලිවීමේ දී යම් වැරදීමක් සිදු වුවහොත් එය පැහැදිලිව තනි ඉරකින් කපා හැර නැවත ලියා අත්සන යොදන්න.
5. එක් එක් ප්‍රශ්නයේ අනු කොටස්වල පිළිතුරු සඳහා හිමි ලකුණු ඒ ඒ කොටස අවසානයේ △ ක් තුළ භාග සංඛ්‍යාවක් ලෙස ලියා දක්වන්න. අවසාන ලකුණු ප්‍රශ්න අංකයත් සමඟ □ ක් තුළ, භාග සංඛ්‍යාවක් ලෙස ඇතුළත් කරන්න. ලකුණු සටහන් කිරීම සඳහා පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා ඇති තීරුව භාවිත කරන්න.
6. ගණිත පරීක්ෂක විසින් ලකුණු නිවැරදි බව සටහන් කිරීමට නිල් හෝ කළු පෑනක් භාවිතා කළ යුතුය.

**උදාහරණ : ප්‍රශ්න අංක 03**

(i) ..................................................... √ △ $\frac{4}{5}$

(ii) ..................................................... √ △ $\frac{3}{5}$

(iii) ..................................................... √ △ $\frac{3}{5}$

(03) (i) $\frac{4}{5}$ + (ii) $\frac{3}{5}$ + (iii) $\frac{3}{5}$ — එකතුව → □ $\frac{10}{15}$

**බහුවරණ උත්තරපත්‍ර :**

01. කවුළු පත්‍රය සැකසීම

I. ලකුණු දීමේ පටිපාටිය අනුව නිවැරදි වරණ කවුළු පත්‍රයේ සටහන් කරන්න.

II. එසේ ලකුණු කළ කවුළු බ්ලේඩ් තලයකින් කපා ඉවත් කරන්න.

III. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබා ගත හැකි වන පරිදි විභාග අංක කොටුව හා නිවැරදි පිළිතුරු ගණන දක්වෙන කොටුව ද කපා ඉවත් කරන්න.

IV. හරි පිළිතුරු හා වැරදි පිළිතුරු ලකුණු කළ හැකි වන පරිදි එක් එක් වරණ පේළිය අවසානයේ හිස් තීරයක් ද කපා ඉවත් කරන්න.

V. විෂය අංකය හා විෂය පැහැදිලිව පෙනෙන ආකාරයට එම කොටු ද කපා ඉවත් කරන්න.

**VI. කපා ගත් කවුළු පත්‍රය ප්‍රධාන පරීක්ෂකවරයා ලවා අත්සන් යොදා අනුමත කර ගන්න.**

02. **අනතුරුව උත්තරපත්‍ර හොඳින් පරීක්ෂා කර බලන්න. කිසියම් ප්‍රශ්නයකට එක් පිළිතුරකට වඩා ලකුණු කර ඇත්නම් හෝ එකම පිළිතුරක්වත් ලකුණු කර නැත්නම් හෝ වරණ කැපී යන පරිදි ඉරක් අඳින්න. ඇතැම් විට අයදුම්කරුවන් විසින් මුලින් ලකුණු කර ඇති පිළිතුරක් මකා**

**වෙනත් පිළිතුරක් ලකුණු කර තිබිය හැක. එසේ මකන ලද අවස්ථාවකදී පැහැදිලිව මකා නොමැති නම් මකන ලද වරණය මත ද ඉරක් අඳින්න.**

03. කවුළු පත්‍රය උත්තරපත්‍රය මත නිවැරදිව තබන්න. නිවැරදි පිළිතුර ✓ ලකුණකින් ද, වැරදි පිළිතුර x ලකුණකින් ද ලකුණු කරන්න. නිවැරදි පිළිතුරු සංඛ්‍යාව ඒ ඒ වරණ තීරයට පහළින් ලියා දක්වන්න. අනතුරුව එම සංඛ්‍යා එකතු කර මුළු නිවැරදි පිළිතුරු සංඛ්‍යාව අදාළ කොටුව තුළ ලියන්න.

**ව්‍යුහගත රචනා හා රචනා උත්තරපත්‍ර :**

1. අයදුම්කරුවන් විසින් උත්තරපත්‍රයේ හිස්ව තබා ඇති පිටු හරහා රේඛාවක් ඇඳ කපා හරින්න. **වැරදි හෝ නුසුදුසු පිළිතුරු යටින් ඉරි ඇඳ වැරදි දමන්න. ලකුණු දිය හැකි ස්ථානවල හරි ලකුණු යෙදීමෙන් එය පෙන්වන්න.**

2. ලකුණු සටහන් කිරීමේදී ඕවර්ලන්ඩ් කඩදාසියේ දකුණු පස තීරය යොදා ගත යුතු වේ.

3. සෑම ප්‍රශ්නයකට ම දෙන මුළු ලකුණු උත්තරපත්‍රයේ මුල් පිටුවේ ඇති අදාළ කොටුව තුළ ප්‍රශ්න අංකය ඉදිරියෙන් **අංක දෙකකින් ලියා දක්වන්න.** ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් අනුව ප්‍රශ්න තෝරා ගැනීම කළ යුතුවේ. සියලු ම උත්තර ලකුණු කර ලකුණු මුල් පිටුවේ සටහන් කරන්න. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස්වලට පටහැනිව වැඩි ප්‍රශ්න ගණනකට පිළිතුරු ලියා ඇත්නම් අඩු ලකුණු සහිත පිළිතුරු කපා ඉවත් කරන්න.

4. පරීක්ෂාකාරීව මුළු ලකුණු ගණන එකතු කොට මුල් පිටුවේ නියමිත ස්ථානයේ ලියන්න. උත්තරපත්‍රයේ සෑම උත්තරයකටම දී ඇති ලකුණු ගණන උත්තරපත්‍රයේ පිටු පෙරළමින් නැවත එකතු කරන්න. එම ලකුණ ඔබ විසින් මුල් පිටුවේ එකතුව ලෙස සටහන් කර ඇති මුළු ලකුණට සමාන දැයි නැවත පරීක්ෂා කර බලන්න.

**ලකුණු ලැයිස්තු සකස් කිරීම :**

I. එක් පත්‍රයක් පමණක් ඇති විෂයන් හැර ඉතිරි සියලු ම විෂයන්හි අවසාන ලකුණු ඇගයීම් මණ්ඩලය තුළදී ගණනය කරනු නොලැබේ.

II. එක් එක් පත්‍රයට අදාළ අවසාන ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවලට ඇතුළත් කළ යුතුය.

III. I පත්‍රයට අදාළ ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ **ඇතුළත් කර අකුරෙන් ද ලියන්න.**

IV. II පත්‍රයේ ලකුණු ලැයිස්තුව සැකසීමේ දී විස්තර ලකුණු ඇතුළත් කිරීමෙන් අනතුරුව II පත්‍රයේ අවසාන ලකුණු, ලකුණු ලැයිස්තුවේ "Total Marks" තීරුවේ ඇතුළත් කරන්න.

V. 43 චිත්‍ර විෂයයේ I, II හා III පත්‍රවලට අදාළ ලකුණු වෙන වෙනම ලකුණු ලැයිස්තුවල ඇතුළත් කර **අකුරෙන් ද ලිවිය යුතු වේ.**

VI. 21 - සිංහල භාෂාව හා සාහිත්‍යය, 22 - දෙමළ භාෂාව හා සාහිත්‍යය යන විෂයන්හි I පත්‍රයේ ලකුණු ඇතුළත් කර අකුරෙන් ලිවිය යුතු ය. II හා III පත්‍රවල විස්තර ලකුණු ඇතුළත් කර ඒ ඒ පත්‍රයේ මුළු ලකුණු, ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය.

සැ.යු :- **(I) සෑම විටම එක් එක් පත්‍රයට අදාළ මුළු ලකුණු පූර්ණ සංඛ්‍යාවක් ලෙස ලකුණු ලැයිස්තුවට ඇතුළත් කළ යුතු ය. කිසිදු අවස්ථාවක පත්‍රයේ අවසාන ලකුණු දශම සංඛ්‍යාවකින් හෝ භාග සංඛ්‍යාවකින් නොතැබිය යුතු ය.**

**(II) ලකුණු ලැයිස්තුවල සෑම පිටුවකම ලකුණු ඇතුළත් කළ සහකාර පරීක්ෂක, ලකුණු පරීක්ෂා කළ සහකාර පරීක්ෂක, ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක හා ප්‍රධාන පරීක්ෂක තම සංකේත අංකය යොදා අත්සන් කිරීමෙන් නිරවද්‍යතාව තහවුරු කිරීම අනිවාර්ය වේ.**

# අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2023 (2024)

## 1. පත්‍රය - චිත්‍ර

**ඉගෙනුම්ඵල** :-

1 - ප්‍රායෝගික අභ්‍යාස තුළින් ලබන සිද්ධාන්ත හා ශිල්ප ක්‍රම පිළිබඳ අවබෝධය මෙන් ම පෝෂණය කරගත් නිපුණතා පිරික්සීම හා මැන බැලීම.

2 - පාරම්පරික කලා කර්මාන්ත පිළිබඳ, ශිල්ප ක්‍රම, අලංකාර විධි, අමුද්‍රව්‍ය භාවිතය හා ආශ්‍රිත ප්‍රදේශ පිළිබඳ ප්‍රජානන හැකියාව පිරික්සීම.

3 - විශ්ව ශිල්පීන් හා ඔවුන්ගේ කලා කෘති හඳුනාගෙන ඒවායේ පසුබිම, මාධ්‍ය භාවිතය, වස්තු විෂය, ශිල්ප ක්‍රම හා භාව ප්‍රකාශන පිළිබඳ ඇගයීමේ හා රසවිඳීමේ හැකියාව මැන බැලීම.

4- ශ්‍රී ලංකාව, ඉන්දියාව, යුරෝපය ආශ්‍රිත සම්භාව්‍ය කලා නිර්මාණයන්ගේ සංස්කෘතික පසුබිම පිළිබඳ නිපුණතා පිරික්සීම.

චිත්‍ර 1, ප්‍රශ්න පත්‍රය සකසා ඇත්තේ එම ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සපයන අයුරිනි. ප්‍රශ්න 40 ක් අඩංගු වන මෙම පත්‍රයේ නිවැරදි පිළිතුරු ✓ ලකුණින් ද වැරදි පිළිතුරු × ලකුණින් ද රතුපාටින් ලකුණු කළ යුතු වේ. එකිනෙක ප්‍රශ්නයේ අංකයට මුලින් හරි වැරදි ලකුණු යෙදීම පහසුවේ. අපේක්ෂකයා යම් ප්‍රශ්නයකට පිළිතුරු සපයා නැත්නම් එම ප්‍රශ්නයේ තිත් ඉර මත රතු පාටින් ඉරක් ඇඳ වැරදි පිළිතුරක් සේ සලකා × ලකුණ යොදන්න.

ප්‍රශ්න පත්‍රයේ අඩංගු ප්‍රශ්න විවිධ රටාවන් අනුව සකසා ඇත. ඡායා රූ ඇසුරු කරගෙන පිළිතුරු විමසන, කෙටි පිළිතුරු සපයන, හිස්තැන් පුරවන, ඡායා රූ සමූහයක් සම්බන්ධතා අනුව එකිනෙක සැසඳීමට සලස්වන, අර්ථ පැහැදිලිවනසේ වාක්‍ය තැනීම හා කලා කෘති ඇගයීමට බඳුන් කරවන, ප්‍රශ්න රටාවන්ගෙන් සමන්විත වේ. විෂය නිර්දේශයේ අන්තර්ගතය තුළ සකසෙන ප්‍රශ්න අතර ඉතා පහසු ඒවා මෙන් ම ක්‍රමයෙන් ගැඹුරු වී යන ප්‍රශ්න ද තිබීම ප්‍රශ්න පත්‍රයක ස්වභාවයයි. විෂය මාලාව අවසන් කර විභාගයට ඉදිරිපත් වන සියලුම අපේක්ෂකයන් විෂය නිර්දේශයේ අන්තර්ගත විෂය කරුණු අධ්‍යයනය කර අපේක්ෂිත අරමුණු හා නිපුණතා කරා ළඟා වී තිබේය යන උපකල්පනය ප්‍රශ්න පත්‍රය සැකසීමේ දී ප්‍රධාන සාධකය බවට පත්ව ඇත. සිසුන් එම තත්ත්වයන්ට පත් වීම හෝ නොවීම පන්ති කාමරයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය මත රඳා පවතී. කිසියම් රටාවකට අනුගතව ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයන අයුරු උගන්වනවා වෙනුවට ඕනෑම අභියෝගයකට මුහුණ දියහැකි අයුරින් විෂය දැනුමෙන් සිසුන් පෝෂණය කිරීමේ වැදගත්කම මෙහිලා දැඩිව අවධාරණය කරමු.

ප්‍රශ්න පත්‍රයේ බොහෝ ප්‍රශ්නවලට වාස්තවික ව පිළිතුරු සැපයිය හැකි වන අතර රචනාමය ස්වරූපයෙන් පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න ද ඇතුළත්ව ඇත. කිසියම් පාරිභාෂික වචනයක හෝ සිද්ධාන්තයක අදහස පැහැදිලිව ප්‍රකාශ වන පරිදි අර්ථවත් වැකියක් ලිවීමේ අවස්ථාවක් සලසා ඇත. අපේක්ෂකයා සපයන වැකිය ඇසුරෙන් දෙන ලද වචනයේ අර්ථය හොඳින් පැහැදිලි විය යුතුය. මෙයින් අදහස් කෙරෙනුයේ චිත්‍ර හදාරණ සිසුන්ගේ රචනාමය ප්‍රකාශන හැකියාව මැන බැලීමයි.

ප්‍රශ්න අංක 36 - 40 දක්වා ඇගයීම සඳහා වූ ප්‍රශ්න ද එවැනි නිදහසේ පිළිතුරු සැපයීම සඳහා සැකසුවකි. අපේක්ෂකයාගේට තම දැනුමේ හා වින්දනයේ තරමට නිදහසේ පිළිතුරු සැපයීමට ඉඩ කඩ ඇත. එසේ වුව ද අපේක්ෂකයන් අනවබෝධයෙන් විවිධාකාර පිළිතුරු සපයන බව පෙනේ. සමහර අපේක්ෂකයන් කලා කෘතිය හඳුනා නොගෙන ඒ තුළ දකින දේ ගැන ලියන අවස්ථා දැක ඇත. ඇගයීම යනු කෘතිය හඳුනාගෙන අගය වටහාගෙන විචාරාත්මකව වින්දනාත්මකව විග්‍රහ කිරීමයි. කලා කෘතිය ද්‍රව්‍යමය භාණ්ඩයක් සේ සලකා එහි දකින දේ විග්‍රහ කිරීම ඇගයීමක් නොවනු ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීමේ දී අරමුණු පහක් ඔස්සේ පිළිතුරු සැපයීමට සලස්වා ඇත්තේ ඒ ඔස්සේ නිසි ඇගයීමකට ප්‍රවේශයක් ලබාදෙන අටියෙනි. එසේ ම මෙහි දී අංග සම්පූර්ණ වාක්‍යකින් පිළිතුර සැපයීම අපෙක්ෂා කෙරේ. එහෙයින් තනිවචනයකින් සපයා ඇති පිළිතුරු සඳහා ලකුණු දීමෙන් වළකින්න.

ප්‍රථමයෙන් ම අපේක්ෂකයා කලාකෘතිය හඳුනාගෙන ඇති බවට සෑහීමට පත්විය හැකි විය යුතු ය. දී ඇති කලා කෘතිය විෂය නිර්දේශයේ අන්තර්ගත ඒකකයක් හා සෘජු ලෙස සම්බන්ධ වන්නක් වන හෙයින් අනිවාර්යයෙන් ම අපේක්ෂකයාට එය හඳුනාගැනීමට හැකිවීම වැදගත් ය. ඒ අනුව එය හඳුනාගත් බව ,තේමාව, ශිල්ප ක්‍රම, ශිල්පීය කුසලතාව, භාවමය හැඟීම්, විග්‍රහ වන පරිදි දී ඇති උප ශීර්ෂ යටතේ නිරවුල් වාක්‍ය පහක් ලිවිය යුතු වේ. එම වාක්‍ය තුළින් කලාකෘතිය පිළිබඳව උප ශීර්ෂයෙන් අපේක්ෂිත අර්ථය පැහැදිලි විය යුතු ය. මෙම පිළිතුරු වාස්තවික බවින් තොර වීම හා රචනා ස්වරූපයක් ගන්නා බැවින් ඉතා විමසිලිමත් ලකුණු ප්‍රදානය කිරීම ද කළ යුතු වේ. අපේක්ෂිත අරමුණුවලින් බැහැරව හෝ අර්ථය පැහැදිලිව ඉදිරිපත් නොවන සේ සපයා ඇති පිළිතුරු වලට ලකුණු දීමෙන් වළකින්න.

II හා III යන ප්‍රායෝගික පත්‍ර සඳහා ලකුණු 30 න් තීරණය කිරීම සිදුවන බැවින් එහි විෂමතා සිදු වීමට ඇති ඉඩකඩ වැඩිය. මෙය 100 යේ ප්‍රතිශතයක් සේ සැලකිය හැකි නම් පිළිතුරු පත්‍රයට හිමි ලකුණු නිවැරදිව තීරණය කිරීමට පහසුවනු ඇත.

II හා III යන ප්‍රායෝගික පත්‍ර සඳහා ලකුණු තීරණය

| ලකුණ | පරාසය |
|---|---|
| 1 | 01,02,03 |
| 2 | 04,05,06,07 |
| 3 | 08,09,10 |
| 4 | 11,12,13 |
| 5 | 14,15,16,17 |
| 6 | 18,19,20 |
| 7 | 21,22,23 |
| 8 | 24,25,26,27 |
| 9 | 28,29,30 |
| 10 | 31,32,33 |
| 11 | 34,35,36,37 |
| 12 | 38,39,40 |
| 13 | 41,42,43 |
| 14 | 44,45,46,47 |
| 15 | 48,49,50 |
| 16 | 51,52,53 |
| 17 | 54,55,56,57 |
| 18 | 58,59,60 |
| 19 | 61,62,63 |
| 20 | 64,65,66,67 |
| 21 | 68,69,70 |
| 22 | 71,72,73 |
| 23 | 74,75,76,77 |
| 24 | 78,79,80 |
| 25 | 81,82,83 |
| 26 | 84,85,86,87 |
| 27 | 88,89,90 |
| 28 | 91,92,93 |
| 29 | 94,95,96,97 |
| 30 | 98,99,100 |

# 43 - චිත්‍ර

1. ශිව දේවාලය අංක 02
2. පාදමක් / අත්තිවාරමක්
3. දකුණු ඉන්දීය චෝල / චෝල
4. අන්තරාලය
5. ශිඛරය

6. සකපෝරුව / අත් සකපෝරුව
7. කුරුළු කළාල
8. මහාරාජලීලාසන / රාජලීලාසන
9. හිස කුඩාවට යෙදීම
10. කාටූන් චිත්‍ර

11. 2
12. 1
13. 4
14. 1
15. 2

16. • ගම්පොල යුගයට අයත් ලංකාතිලක විහාරයේ නිර්මාණ ශිල්පියාය.
    • අතීත රජ දවස රජවරුන් විසින් දක්ෂතම ශිල්පියාට ප්‍රදානය කරන ලද ගෞරව නාමයකි.
17. • ස්ථූපයේ ගර්භයට ඉහළින් පිහිටි හර්මිකාව / හතරැස් කොටුව මධ්‍යයේ සිටුවා ඇති මුදුන උල්වූ ශෛලමය ස්ථම්භය (අටපට්ටම් / වෘත්තාකාර) වේ.
    • සාංචි ස්ථූපයේ ගර්භයේ ඉහළ ඡත්‍ර තුන දරා සිටින මුදුන උල් වූ අටපට්ටම් සෙල්මුවා ස්ථම්භය වේ.
18. ගොතික් ක්‍රමයේ දේවස්ථානවල දක්නට ලැබෙන සිතුවම් සඳහා යොදා ගන්නා වර්ණවත් වීදුරු කැබලි වේ.
19. මානව හා සත්ත්ව රූප නිර්මාණයේදී එක් පසෙකට හැරී ඇති ආකාරයෙන් දැක්වීම (මිසර සිතුවම් / මධ්‍ය මහනුවර යුගයේ සිතුවම්)
20. ස්පාඤ්ඤයේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් දක්නට ලැබෙන ගුහාවකි.

21. D
22. A
23. E
24. B
25. C

26. කතළුව
27. ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී / යුරෝපීය ස්වභාවිකවාදී
28. ඒකවාර්ණික / මොනෝක්‍රෝම්
29. ඉසුරුමුණිය
30. පෙරියතම්බි සුබ්‍රමනියම්

31. නෙලීම / අල්ප උන්නත
32. ගල් ගරාදි වැටකින් / ගරාදි වැටකින්
33. උද්භිද
34. තෙල්සායම්
35. ස්ටැන්ලි අබේසිංහ


36. මෙම සිතුවම නිර්මාණය කරන ලද්දේ, පුබුදු යුගයේ විශිෂ්ටතම චිත්‍ර ශිල්පියා වූ ලියනාඩෝ ඩාවින්චි ශිල්පියා විසිනි.
37. මෙම සිතුවම අවසන් භෝජන සංග්‍රහය නමින් හඳුන්වයි.
38. යුරෝපීය ශාස්ත්‍රාලයීය යථාර්ථවාදී (ස්වභාවිකවාදී) ශෛලියට අනුව ඇඳ ඇත.
39. 
    - අවකාශමය පර්යාලෝකය අනුව චිත්‍රණය කර ඇති මෙම සිතුවම මධ්‍යයෙහි ජේසුස් වහන්සේ දක්වා ඇති අතර අනුගාමිකයින් දෙපස සිටින ලෙස සංරචනය කර ඇත.
    - සිතුවම මැද ජේසුතුමන්ගේ රුව ස්ථානගත කර ඇති අතර එතුමන් දෙපස අනුගාමිකයින් දොළොස් දෙනා තිදෙනා බැගින් කණ්ඩායම් හතරකට බෙදී යන සේ සංරචනය කර ඇත.
40. 
    - කියරොස්කුරෝ (CHIAROSCURO) සිද්ධාන්තයට අනුව උචිත වර්ණමාලාවක් භාවිත කරමින්, අවස්ථාවෝචිතව මානව හැඟීම් හා ඉරියව් ඉතා මැනවින් දක්වා ඇත.
    - ජේසුතුමන්ගේ නොසැලෙන බවත්, පාවා දෙන්නාගේ කුතුහලයත්, නොසංසුන් බවත්, සෙසු සාමාජිකයන්ගේ වික්ෂිප්ත බවත් වැනි මනෝභාවයනුත් මැනවින් දක්වා ඇත.

## 11. පත්‍රය - නිදහස් රේඛාමය ඇඳීම හා වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය

### ඉගෙනුම් ඵල

1 - ස්වභාවික හා නිර්මිත වස්තූන්ගේ ගති ස්වභාවය හා හැඩය තේරුම් ගැනීමේ හැකියාව හා සිද්ධාන්ත භාවිතයේ කුසලතාව හා ක්‍රමශිල්ප භාවිතය මැනබැලීම.
2 - රේඛා මාධ්‍ය භාවිතයෙන් වස්තූන්ගේ ගති ලක්ෂණ නිරූපණය වන සේ ප්‍රකාශ කිරීමේ හැකියාව හා සම්පිණ්ඩනය කිරීමේ හැකියාව මැන බැලීම.
3 - වර්ණ භාවිත කිරීමේ ක්‍රම ශිල්ප හා වස්තූන්ගේ ගති ලක්ෂණ මතුවන සේ වර්ණ භාවිතය පිළිබඳ හැකියාව මැන බැලීම.

11. පත්‍රය සඳහා අපේක්ෂකයන් සපයන ලද ප්‍රායෝගික පිළිතුරු අතර චිත්‍ර දෙකක් වෙයි. ඉන් එකක් රේඛා මගින් කරනු ලබන අධ්‍යයනයක් වන අතර අනෙක වර්ණ චිත්‍රයකි. මෙම චිත්‍ර දෙකම ඇගයීමට භාජනය කළ යුතු ය. ලකුණු දීමේ පටිපාටියේ පළමුවන නිර්ණායකය රේඛා අධ්‍යයනය සඳහා යොදා ගත යුතු වේ.



## රේඛා අධ්‍යයනය

මෙයින් අපේක්ෂා කෙරෙනුයේ අපේක්ෂකයා විසින් තමා ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය පිළිබඳව මූලික අධ්‍යයනයක යෙදීමයි. සමහරු මෙය තේරුම් ගෙන ද්‍රව්‍යයන්ගේ හැඩ වෙන වෙනම අධ්‍යයනය කළ අවස්ථා දක්නට ඇතත් සමහර අපේක්ෂකයෝ එම ද්‍රව්‍ය සමූහයේ රේඛා චිත්‍රයක් ඇඳ දක්වති. කෙසේ වෙතත් මෙම රේඛා අධ්‍යයනය තුළින් රේඛාව හැසිරවීමේ කුසලතාව පිළිබිඹු විය යුතු වේ. මේ අනුව අපේක්ෂකයා රේඛාව පිළිබඳ ප්‍රදර්ශනය කර ඇති කුසලතාව ගැන සලකා ඒ සඳහා හිමි ලකුණු පහෙන් ( 05 ) දිය යුතු ලකුණු ප්‍රමාණය ( 1.වැනි නිර්ණායකයට අනුව ) තීරණය කළ යුතු වේ.

## වර්ණ චිත්‍රය

මෙයින් ද්‍රව්‍ය සමූහය ඇසුරෙන් යථාරූපී චිත්‍රයක් ඇඳ වර්ණ කර නිම කිරීම අපේක්ෂා කෙරේ. මේ සඳහා ලකුණු ප්‍රදානය කිරීමේ දී අදාළ නිර්ණායකයන් යටතේ ම ලකුණු තීරණය කළ යුතු වේ. එකිනෙක නිර්ණායකයන් යටතේ අපේක්ෂකයා කොතෙක් දුරට ලගා වී ඇත්දැයි නිවැරදි තීරණයකට එළඹ ලකුණු තීරණය කළ මැනවි. මෙහිදී තම රුචිය අනුව චිත්‍රය ඇගයීමට භාජනය නොකළ යුතු අතර අපේක්ෂකයා ප්‍රදර්ශනය කර ඇති කුසලතා තේරුම් ගෙන එය පදනම් කරගෙන ඇගයීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | රේඛා අධ්‍යයනය | - ලකුණු 05 |
| 2 - | ද්‍රව්‍ය සමූහය තලය මත අර්ථවත්ව සංරචනය කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| 3 - | ද්‍රව්‍යයන්ගේ පරිමාණ හා ස්වභාවය ප්‍රකාශ කිරීමේ හැකියාව | - ලකුණු 05 |
| 4 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය (පර්යාලෝකය, ත්‍රිමාණ ලකෂණ, ඇස්මට්ටම, අවකාශ භාවිතය) | - ලකුණු 05 |
| 5 - | වර්ණ භාවිතය හා ගති ලකෂණ දැක්වීම | - ලකුණු 05 |
| 6 - | චිත්‍රයේ පසුතලය ඇතුළු සමස්ථ නිමාව | - ලකුණු 05 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

OL/2023(2024)/43-S-III    89786

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**43 | S | III**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2023 (2024)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2023 (2024)
General Certificate of Education (Ord. Level) Examination, 2023 (2024)

චිත්‍ර III
சித்திரம் III
Art III

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

**උපදෙස් :**

- ඔබ ඇඳිය යුත්තේ **එක්** වර්ණවත් චිත්‍රයක් පමණි.
- ඔබේ **විභාග අංකය** හා අදාළ **ප්‍රශ්න අංකය** උත්තර පත්‍රයේ නියම කර ඇති ස්ථානයේ පැහැදිලි ව ලියන්න.
- උත්තර පත්‍රය විභාග ශාලාධිපතිට භාර දෙන විට චිත්‍රය සම්පූර්ණයෙන් වියළී තිබිය යුතු ය. තෙත් චිත්‍ර එකට ඇලී තිබීම ඔබට අවාසිදායක විය හැකි ය.
- දිය සායම්, පෝස්ටර් සායම්, පැස්ටල් ඇතුළු අතේ නොගෑවෙන ඕනෑ ම වර්ණ මාධ්‍යයක් වර්ණ කිරීම සඳහා භාවිත කළ හැකි ය.
- චිත්‍ර ඇඳීමේ විශේෂ කඩදාසිය සමග A4 ප්‍රමාණයේ රළු කඩදාසියක් සහ විෂු කඩදාසි සපයනු ලැබේ.

'අ' කොටසින් හෝ 'ආ' කොටසින් හෝ 'ඉ' කොටසින් හෝ **එක් ප්‍රශ්නයක් පමණක්** තෝරාගන්න.

## 'අ' කොටස - චිත්‍ර සංරචනය

1. ආගමික ස්ථානයක් ඉදිකිරීමේ දී ශ්‍රමයෙන් දායක වන පිරිසක්
2. ජංගම බේකරි නිෂ්පාදන අලෙවි රථයකින් ආහාර මිලදී ගන්නා පිරිසක්
3. අභය භූමියක වන සතුන් නරඹන්නෝ
4. ඔබ සිත්ගත් ඓතිහාසික සිද්ධියක්

## 'ආ' කොටස - මෝස්තර නිර්මාණය

5. සාම්ප්‍රදායික සැරසිලි ඒකක හා වර්ණ භාවිත කර අඩි 6' × 8' ප්‍රමාණයෙන් මේස රෙද්දක් ඇඳ වර්ණ ගන්වන්න. (පරිමාණානුකූලව තලයට ගලපාගන්න.)
6. සරමකට සුදුසු වාටි මෝස්තරයක් සත්ත්වරූප ඇසුරින් සැලසුම් කර උචිත පරිදි වර්ණ කරන්න.
7. නිවසක ආලින්දයේ තැබීමට සුදුසු විසිතුරු මැටි බඳුනකට නිර්මාණාත්මකව හැඩයක් සැලසුම් කර එයට ගැලපෙන සැරසිලි භාවිත කරමින් වර්ණ ගන්වන්න.

## 'ඉ' කොටස - ග්‍රැෆික් චිත්‍ර

8. විදුලිය අරපිරිමැස්මෙන් භාවිත කිරීමේ අගය විදහා දැක්වෙන පෝස්ටර් චිත්‍රයක් සැලසුම් කර වර්ණ කරන්න.
9. 'පාරම්පරික ජනකලා' මැයෙන් ලියැවුණු පොතකට සුදුසු වර්ණවත් පිටකවරයක් (මුල් පිටුව පමණක්) සැලසුම් කර වර්ණ කරන්න.
10. 'පිය සෙනෙහස' පිළිබඳ ලියවුනු කාව්‍ය පංතියකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් සැලසුම් කර වර්ණ ගන්වන්න.

***

111. පත්‍රය - 1. කොටස - චිත්‍ර සංරචනය

**ඉගෙනුම් ඵල** - ස්වභාවධර්මයේ දක්නට ලැබෙන ස්වාභාවික මෙන්ම නිර්මිත පරිසරයන්ගේ හා වස්තූන්ගේ ස්වභාවයත් ඒ තුළ සිදුවන සිද්ධීන් හා ක්‍රියාදාමයන් පිළිබඳවත් ලබා ඇති අත්දැකීම් චිත්‍රමය භාෂාව තුළින් ප්‍රකාශ කිරීමේ නිර්මාණශීලී කුසලතාව හා රසඥතා වර්ධනය පිළිබඳ නිපුණතා ඇගයීම.

අපේක්ෂකයන් තෝරාගෙන ඇති මාතෘකා ප්‍රකාශ කිරීමේ දී විවිධ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති අයුරු දක්නට ලැබේ. රේඛාව හැසිරවීමේ හා හැඩතල ප්‍රකාශනයේ දී අවම කුසලතා මෙන් ම උපරිම කුසලතා ප්‍රදර්ශනය කළ අවස්ථා මෙන් ම මානව රුව හැසිරවීමේදී ද එවැනි ම විෂමතා දක්නට ලැබෙන අවස්ථා එමට ය. වර්ණ භාවිතය තුළින් ද විවිධ වූ ශිල්ප ක්‍රම භාවිතයෙන් උපරිම කුසලතා දක්වන අය අතර ප්‍රායෝගික කුසලතා පෝෂණය කර නො ගත් අපේක්ෂකයෝ ද වෙති. මේ නිසා එකිනෙක අපේක්ෂකයන් පෙන්වා ඇති ප්‍රායෝගික කුසලතාවන්ගේ මට්ටම හඳුනාගෙන ඒ අනුව නිර්ණායකයන් පදනම් කරගෙන ලකුණු ප්‍රදානය කළ යුතු වේ. මෙහිදී ද පුද්ගල බද්ධ රුචිකත්වය ගැන නොසලකා ලකුණු ප්‍රදානය කළ මැනවි.

ලකුණු දීමේ නිර්ණායක

| | | |
|---|---|---|
| 1 - | තෝරාගත් මාතෘකාව ප්‍රකාශ කිරීමේදී ඊට උචිත වාතාවරණය හා පරිසරය ප්‍රකාශ කර ඇති අයුරුව | - ලකුණු 06 |
| 2 - | රේඛා හැඩතල ඇසුරෙන් මානව රූ ඇතුළු සියලු හැඩතල තලය මත සම්පිණ්ඩනය කර ඇති අයුරුව | - ලකුණු 06 |
| 3 - | සිද්ධාන්ත භාවිතය පිළිබඳ අවබෝධය ( පරිමාණ, පර්යාලෝකය, ත්‍රිමාණ ලක්ෂණ, ඇස්මට්ටම හා අවකාශ භාවිතය) | - ලකුණු 06 |
| 4 - | වර්ණ භාවිතයේ දක්වා ඇති කුසලතාව | - ලකුණු 06 |
| 5 - | අනුගමනය කර ඇති ශෛලීය හා සමස්ත නිමාව | - ලකුණු 06 |
| | ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

111. පත්‍රය - 11 කොටස - මෝස්තර නිර්මාණය

**ඉගෙනුම් ඵල** - දෛනික ජීවිතයේ ඇතිවන විවිධ පාරිභාරික අවශ්‍යතාවන්ට සරිලන පරිදි භාණ්ඩ හා සැරසිලි නිර්මාණ සැලසුම්කරණය හා අලංකරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති කුසලතා පිරික්සීම

111, පත්‍රයට පිළිතුරු සැපයීමේ දී බහුතර අපේක්ෂක සංඛ්‍යාවක් 11 කොටස තෝරාගන්නා බව පෙනේ. මොවුන් අතුරින් වැඩි දෙනෙක් සිද්ධාන්තමය අවබෝධයකින් යුතුව නවතාවකින් යුතු මෝස්තර නිර්මාණයේ යෙදෙන අතර අනවබෝධයෙන් මෝස්තර නිර්මාණය කිරීමට වෙහෙසෙන අය ද බොහෝ ය. කෙසේ වෙතත් අපේක්ෂකයාන්ගේ නිර්මාණ තුළින් පිළිබිඹු වන්නේ ඔවුන් අත්පත් කරගෙන ඇති නිපුණතාවන්ගේ පරිමාණයයි. නිර්ණායකයන් ඔස්සේ ඔවුන් දක්වා ඇති නිපුණතාවන්ගේ ප්‍රමාණයන් තේරුම් ගෙන ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්ණායක

| | |
|---|---|
| 1 - මාතෘකාවට අදාළ නිර්මාණ කාර්යයට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 2 - පාරිභෝගික අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා කර්මාන්තයට උචිත බව | - ලකුණු 06 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 06 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ කුසලතාව | - ලකුණු 06 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 06 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

## 111 පත්‍රය - 111 කොටස - ග්‍රැෆික් චිත්‍ර

**ඉගෙනුම් ඵල** - සන්නිවේදන කාර්යය , මුද්‍රණ ක්‍රියාවලිය හා වාණිජ අවශ්‍යතාවන්ට සරිලන චිත්‍රකලා නිර්මාණ හා සැලසුම්කරණය පිළිබඳ අපේක්ෂකයා ලබා ඇති නිපුණතා පිරික්සීම

මෙය අ.පො.ස. (සා පෙළ) ප්‍රශ්නපත්‍රයට එක් වූ නව කොටසකි. ග්‍රැෆික් චිත්‍ර කලාව පිළිබඳව පන්ති කාමරයේ දී ප්‍රගුණ කළ ශිල්ප ක්‍රම හා කුසලතා උපයෝගී කරගෙන ශිෂ්‍යයා මෙම කොටසට පිළිතුරු සපයයි. ඇගයීමේ දී ඔවුන් දක්වා ඇති නිපුණතා හොඳින් හඳුනාගෙන ප්‍රකාශනයේ නිර්මාණශීලී බව සලකා ලකුණු ප්‍රදානය කිරීම කළ යුතු වේ.

## ලකුණු දීමේ නිර්නායක

| | |
|---|---|
| 1 - මාතෘකාවට උචිත අයුරින් නවතාවකින් යුතුව සැලසුම් කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 2 - වාණිජමය හා සන්නිවේදන අවශ්‍යතාවන්ට ගැලපෙන බව හා මුද්‍රණයට උචිත බව | - ලකුණු 06 |
| 3 - රේඛා හැඩතල අර්ථවත්ව යොදාගැනීමේ හැකියාව | - ලකුණු 06 |
| 4 - උචිත වර්ණ තෝරා ගැනීමේ හා භාවිත කිරීමේ හැකියාව | - ලකුණු 06 |
| 5 - විචිත්‍රත්වය, චමත්කාරය හා නිර්මාණයේ සාර්ථකත්වය | - ලකුණු 06 |
| ප්‍රශ්න පත්‍රයට හිමි මුළු ලකුණු | - ලකුණු 30 |

උත්තර පත්‍ර නැවත සමීක්ෂණයන්හිදී ඇතැම් පරීක්ෂකවරුන් අතින් සිදු වූ බරපතල වැරදි ගැන වාර්තා වූ අවස්ථා බොහෝ ය. එවැනි වැරදි සිදුවීම් වළක්වා ගැනීම පරීක්ෂක වරුන්ගේ දැඩි වගකීමක් වනු ඇත.

**එසේ වාර්තා වී ඇති වැරදි අතර -----**

- ★ වැරදි පිළිතුරු ✓ පිළිතුරු ලෙසත්, හරි පිළිතුරු × පිළිතුරු ලෙසත්, සලකා ලකුණු කර තිබීම.
- ★ ඇතැම් පිළිතුරු ලකුණු නොකොට මගහැර තිබීම.
- ★ ලකුණු කිරීමේදී යොදන ලකුණු තේරුම් ගැනීමට නොහැකි වීම.
- ★ ලකුණු එකතු කිරීමේ දී සිදුවූ වැරදි.
- ★ මුල් පිටුවේ ලකුණු අවසන් ලකුණු ලැයිස්තුවට ගැනීමේ දී සිදු වූ වැරදි.
- ★ එකිනෙක පත්‍රවල අවසාන ලකුණ වටරවුමකින් නොදැක්වීම.
- ★ 11, 111, වැනි ප්‍රායෝගික උත්තර පත්‍ර නිසි ලෙස ඇගයීමට ලක් නොවීම.
- ★ 11, 111, පත්‍රවල නිර්ණායක නොසලකා ලකුණු ප්‍රධානය කිරීම.
- ★ දෙවනවර පරීක්ෂා කළ බවට සහකාර පරීක්ෂකවරයාගේ සංකේත අංකය සහ කෙටි අත්සන යොදා නොතිබීම.
- ★ ඉලක්කම් පැහැදිලිව යොදා නොතිබීම.
- ★ ඉතා ඉහළ මට්ටමේ කුසලතා ප්‍රදර්ශනය කර ඇති උත්තර පත්‍රවලට අඩු ලකුණකුත් , කුසලතා ප්‍රදර්ශනය නොවන සමහර චිත්‍රවලට ඉහළ ලකුණකුත් ප්‍රධානය කිරීම.
- ★ ප්‍රශ්න පත්‍රයට හිමි ලකුණ අභිබවා යමින් උවමනාවෙන්ම සාමර්ථ්‍ය හෝ සම්මාන ප්‍රධානය කිරීමට උත්සාහ දැරීම.

වැනි වැරදි පෙන්වා දිය හැකි ය. මෙයින් බරපතලම වරද ලෙස පෙන්වා දිය හැක්කේ 11, 111, පත්‍රවල සිදුවන අධි තක්සේරුව හා ඌණ තක්සේරුවයි. මේ නිසා නැවත සමීක්ෂණයේදී ලකුණු විශාල ලෙස ඉහළ පහළ ගිය අවස්ථා බොහෝ ය. මෙවැනි සිදුවීම් සම්පූර්ණයෙන් ම මගහරවා ගැනීම සියලුම පරීක්ෂක වරුන් ගේ දැඩි වගකීමකි.

ඉහත සඳහන් කරුණු සැලකිල්ලට ගෙන ඇගයීම් කටයුතු කාර්යක්ෂමව ඉටුකිරීමෙන් හා ලකුණු ලැයිස්තු ක්‍රමවත්ව පිළියෙල කිරීමෙන් ඵලදායී ඇගයීමකට දායක වීම දැයේ දරුවන් වෙනුවෙන් ඉටුකෙරෙන ජාතික මෙහෙවරක් වනු ඇත.

සැලකිය යුතුයි ,
ඔබ වෙත සපයන ලද RD / 16 / 3 /OL ආකෘති පත්‍ර දෙකෙන් එකක් මණ්ඩලයේ වැඩ නිමවූ දිනම ප්‍රධාන පාලක පරීක්ෂක වෙත තැපැල් කර යවන්න.